# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2015 මාර්තු මස 27 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2015.03.30 දින නිකුත් කරන ලදී)**

# ආර්ථික සේවා ගාස්තු (සංශෝධන)

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

**2 වන වගන්තිය :** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන" 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, යම් බැංකුවක්, මුදල් සමාගමක් හෝ කල්බදු සමාගමක් බැංකුවක, මුදල් සමාගමක හෝ මූල්‍ය කල්බදු සමාගමක ව්‍යාපාරික කටයුතු අත්කර ගනු ලබන හෝ එම ව්‍යාපාරික කටයුතු සමග ඒකාබද්ධ කරනු ලබන වෙනත් යම් අවස්ථාවක ගෙවනු ලබන ආදායම් බද්දෙන් සේවා ගාස්තු අඩු කිරීම සඳහා අවසර ලබා දීම වේ.

**3 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධනය මේ පනතේ 6 වන වගන්තියට ආනුෂංගික වේ.

**4 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධනය මේ පනතේ 6 වන වගන්තියට ආනුෂංගික වේ.

**5 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධනය මේ පනතේ 6 වන වගන්තියට ආනුෂංගික වේ.

**6 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 10ආ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඉලෙක්ට්‍රොනික සන්නිවේදන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිතා කිරීම සඳහා අවසර ලබාදීම හෝ පහසුකම් සැලසීම වේ.

**7 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ලක් සතොස සේවා ගාස්තු වලින් නිදහස් කිරීම වේ.

එල්. ඩී.—ඕ. 13/2015

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** (1) මේ පනත 2015 අංක දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 3 වන, 4 වන, 5 වන සහ 7 වන වගන්ති හැර මේ පනතේ විධිවිධාන 2015 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක විය යුතු වන අතර මේ පනතේ 3 වන, 4 වන සහ 5 වන වගන්ති වල විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට බලාත්මක විය යුතු ය. 7 වන වගන්තියේ විධිවිධාන 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ බවට සලකනු ලැබිය යුතු ය.

2006 අංක 13 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2014 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 3 වන වගන්තියේ (3අ) උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3ආ) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තාවූ යම් වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තාවූ මුදල් සමාගමක් හෝ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි වී ඇති යම් කල්බදු සමාගමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය අංශ ඒකාබද්ධ කිරීමේ කාර්ය පටිපාටිය යටතේ වෙනත් යම් බැංකුවක, මුදල් සමාගමක හෝ කල්බදු සමාගමක ව්‍යාපාරික කටයුතු අත්කරගනු ලබන හෝ ඒකාබද්ධ කරගනු ලබන අවස්ථාවක දී, එම අත්කර ගැනීම හෝ ඒකාබද්ධ කර ගැනීම සිදුවූ අවුරුද්ද සඳහා ගෙවිය යුතු ආදායම් බදු අඩුකිරීමෙන් පසුව ඉදිරියට ගෙන

2—PL 008875—450 (2015/03)

යැමට සහ එම බැංකු, මුදල් ආයතන හෝ කල්බදු සමාගම් විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකරනු ලැබීමට හිමිකම් ඇති එම බැංකු, මුදල් සමාගම් හෝ කල්බදු සමාගම් විසින් ගෙවනු ලබන සේවා ගාස්තුවල යම් ශේෂයක් ඉතිරි වේ නම් එම ශේෂය, එම බැංකු, මුදල් සමාගම් හෝ කල්බදු සමාගම් විසින් ම ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබූ ලෙස සලකා, ව්‍යාපාරික කටයුතු අත්කරගනු ලැබූ හෝ ඒකාබද්ධ කරනු ලැබූ එම බැංකු, මුදල් ආයතන හෝ කල්බදු සමාගම් විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකරනු ලැබිය යුතු ය.''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ "කොමසාරිස් ජනරාල්වරයා අමතන ලද ලියවිල්ලකින් වූ සන්නිවේදනයක් මගින්" යන වචන වෙනුවට "කොමසාරිස් ජනරාල්වරයා අමතන ලද ලියවිල්ලකින් වූ සන්නිවේදනයක් මගින් හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක් මගින් දැනුම්දීම මගින්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** 2011 අංක 11 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් ආකෘතියක සහ යම් විස්තර ඇතුළත් වාර්තාවක් තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය" යන වචන වෙනුවට "යම් ආකෘතියක සහ යම් විස්තර ඇතුළත් වාර්තාවක් තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** 2014 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්" යන වචන වෙනුවට "ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් හෝ ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක් මගින් වූ දැන්වීමක් මගින්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 10ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියට 10ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ඉලෙක්ට්‍රොනික සන්නිවේදන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිතා කිරීම.

10ආ. අමාත්‍යවරයා විසින්, දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයාගේ නිර්දේශය මත 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිතය සඳහා බලය පැවරීමේ හෝ ඒ සඳහා පහසුකම් සැලසීමේ කාර්ය සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** 2013 අංක 6 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "තැනැත්තා" යන යෙදුමේ අර්ථ නිරූපණය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (ඊ) ඡේදයේ "ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක්; සහ" යන වචන වෙනුවට "ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක්;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (උ) ඡේදයේ "ශ්‍රී ලංකා මහ බැංකුව;" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා මහ බැංකුව; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඌ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති ලක් සතොස ලිමිටඩ් (2011 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වේ).".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.